ආයුර්වේදයෙන් සුවපත් දිවියකට

වසර දහස් ගණනක් තිස්සේ මව්බිමේ පාරම්පරිකව පැවතගෙන ආ දේශීය වෛද්‍ය විද්‍යාවට භාරතයෙන් එක් වූවකි ආයුර්වේද වෛද්‍ය විද්‍යාව. මේ වන විට මව් බිමේ දේශීය ආයුර්වේද රෝහල් පද්ධතියක් ස්ථාපිතව ඇති අතර දේශීය වෛද්‍ය විද්‍යාලය කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව විශ්ව විද්‍යාලයක තත්වයකට නංවා ඇත. කොළඹ රාජගිරියේ පිහිටි දේශීය වෛද්‍යාතනයට අනුබද්ධිතව යක්කල ආයුර්වේද වෛද්‍ය විද්‍යාලය ද ඒ අනුව දේශීය වෛද්‍යවරුන් බිහිකරන ප්‍රධාන ආයතන බවට පත් වී තිබේ.

ආයුර්වේදය ඇසුරින් "සන්නස" ට ලිපි පෙළක් සම්පාදනය කිරීමට කළ ආරාධනය පරිදි වෛද්‍යාචාර්ය ගාමිණී විජේසිංහ (බී. අයි. එම්. එස්. එච්. පී. ඒ.) මහත්මාවිසින් සම්පාදිත ලිපි පෙළකට පෙරවදනයි මේ.

වෛද්‍යාචාර්ය ඊ. ජී. විජේසිංහ මහත්මා කොළඹ දේශීය වෛද්‍ය විද්‍යාලයෙන් වසර 1963 දී පිට වූයේ බී. අයි. එම්. එස්. උපාධිය නිමිකරගනිමිනි. වසර 1966 ආයුර්වේද මහ රෝහලේ වෛද්‍ය නිලධාරිවරයෙකු වශයෙන් පත්වීම් ලබා කුරුණෑගල හා අනුරාධපුර ආයුර්වේද රෝහල්වල වෛද්‍ය අධිකාරි වශයෙන් ද, රාජගිරියේ ආයුර්වේද මහ රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි සහ වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරි වශයෙන්ද උපරිම සේවයක් කළේය ඒ මහත්මා. සිය වෘත්තීය අධ්‍යාපනය වැඩිදියුණු කරගනිමින් එච්. පී. ඒ. පශ්චාත් උපාධිය ලැබුනත්තේ එකල ආයුර්වේද උපදේශකවරයකු වශයෙන් භාරතයෙන් පැමිණි මහා පඬිවරයෙකු වූ ශ්‍රී රාමරක්ෂ පාඨක් මැතිඳුන්ගේ මගපෙන්වීම හා ආභාෂය ඉවහල් කරගනිමිනි. සිය සේවා කාලයේදී ඉන්දීය විශේෂඥ වෛද්‍යවරුන් දෙපළකගේ ගුරුහරුකම් ලබමින් වසර පහක කාලයක් පංච කර්ම විෂය පිළිබඳව විශේෂ පුහුණුවක් ද ලැබීය වෛද්‍යාචාර්යවරයා. මේ සියලු දැනුම් හා පුහුණුව ඇසුරින් දක්ෂ ආයුර්වේද චිකිත්සකයෙකු වශයෙන් ද ප්‍රශංසනීය සේවයක් ඉටු කළ වෛද්‍යාචාර්යවරයා බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් ද දේශීය වෛද්‍ය විද්‍යාතනයට අමිල සේවයක් ඉටුකරයි. දැනට සේවය යෙදී සිටිනා වෛද්‍ය වෘත්තිකයන් පුහුණු කිරීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාව සඳහාද සිය කාලය කැප කළ වෛද්‍යාචාර්යවරයා වසර කිහිපයකට ඉහතදී මෙල්බර්න් නුවර :Australian Collage of Natural Medicine) ඕස්ට්‍රේලියන් කොලේජ් ඔෆ් නැචුරල් මෙඩිසින් ආයතනයේදී කළ වැඩමුළුව මෙහිදී සිහිපත් කළ යුතුය. ආයුර්වේද වෛද්‍ය විද්‍ය හා මූලධර්ම බටහිර වෛද්‍ය විද්‍යාවේ මූලධර්ම ඇසුරින් ඉංග්‍රීසියෙන් පැහැදිලි කර දීමට සිදු වීම එහිදී මුහුණ දුන් ප්‍රබලතම අභියෝගය විය.

පුවත්පත් සඟරා ආදියට ආයුර්වේද විෂය පිළිබඳව විවිධ ලිපි සම්පාදනය කරමින් ශාස්ත්‍රීය කරුණු ඇසුරින් කරගෙන යන්නා වූ එතුමාගේ වෛද්‍ය විද්‍යා ලේඛන කලාවේ අග්‍ර පළයන් ය, "පංච කර්ම" සහ "සැපවත් ආහාරය" ග්‍රන්ථය ද්විත්වය.

විශේෂිතවූ රෝග ගණනාවකට විශේෂඥ දැනුමින් සහ අත්දැකීමෙන් අනූන වූ නුගේගොඩ පවත්වාගෙන යන චිකිත්සාගාරයේ කටයුතු, ඖෂධ නිෂ්පාදන කටයුතු, විශ්ව විද්‍යාලයීය දේශන, පර්යේෂණ කටයුතු හා ලේඛන කටයුතු අතරේ ඉතා කාර්ය බහුලව සිටිනා වෛද්‍යාචාර්ය විජේසිංහයන් "සන්නස" පාඨකයන් වෙනුවෙන් සිය දැනුම බිඳක් ලියා එවන්නට කාලය කැප කිරීම වෙනුවෙන් බෙහෙවින්ම ස්තූති වන්නෙමු, අපි.

වර්ෂ හයදාහකට පමණ පෙර භාරතයේදී එක් විශේෂය ජනක සිදුවීමක් වූයේය. එනම් එකල හිමවතදී ධ්‍යාන වඩා බුද්ධිය දියුණු කළ, එම නිසා අතීතය, වර්තමානය, අනාගතය කියන්නට තරම් හැකියාවක් තිබූ අගිවාර්යෙන්ම ඍෂි නාමයෙන් හැඳින් වූ ප්‍රාණවත් පිරිසක් විසුවෝය. මිනිසුන් අකාලයේ ලෙඩවනු දුටු, මියයනු මේ පිරිස මහත් කම්පාවට පත්ව, මෙයට හේතු කවරේදැයි සාකච්ඡා කරනුවන් රැස්වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් මීට හේතු දැනගැනීම සඳහා ශක්‍රයා හමුවීමට යාමටත්, ඒ සඳහා නියෝජිත පිරිසක් තෝරා ගැනීමටත් තීරණය කරන ලදී. එම නියෝජිත පිරිසේ නායකත්වය උසුලන ලද්දේ භරධ්වාජ ඍෂිවරයායි. භරධ්වාජ ඍෂිගේ බුද්ධි මහිමය දුටු ශක්‍ර දේවේන්ද්‍ර තෙමේ භරධ්වාජ ප්‍රමුඛ පිරිසට ආයුර්වේද විෂය සංක්ෂේප වශයෙන් ප්‍රගුණ කරවන ලදී. එම පිරිසෙහි අතිශය බුද්ධිමත් ඍෂිවරයෙක් වූ ඍෂි පුනර්වසු විසින් අග්නිවේෂ, ගෙල, ජතුකර්ණ පරාශය, භාරිත ක්ෂාරපාණියන ශිෂ්‍යයනට ආයුර්වේද විෂය උගන්වන ලදී. මේ ඍෂීන් අතර ඇති දක්ෂයා වූ අග්නිවේෂ ඍෂි විසින් අග්නිවේෂ සංහිතාව ලියන ලදී. මෙහි රෝග නොවැළඳීම සඳහාත්, වැළඳුන රෝග සුවය සඳහාත් හේතුවන කරුණු උගන්වා ඇත්තේය. එම ග්‍රන්ථය පසුකලෙක චරක ඍෂි විසින් සංස්කරණය ලඳුව චරක සංහිතා නමින් ප්‍රචලිත විය. එම ග්‍රන්ථය සංස්කෘත භාෂාවෙන් මෙන්ම සිංහලට පරිවර්තනය කරන ලදුව අප හමුවේ ඇත. මෙම ආයුර්වේද විෂය අංක අටකින් සමන්විත වන්නේය.

එනම්:

1. කාය චිකිත්සා (Medical Treatment)
2. බාල රෝග චිකිත්සා- (Poediate Treatment)
3. ලාර්ධිවාංග රෝග චිකිත්සා - (Treatment for Ear, Nose, Throat & Eyes)
4. භූත විද්‍යා - (Astrology & Psychological Treatment)
5. ශල්‍ය - (Surgery)
6. විෂ චිකිත්සා -(Toxicology)
7. රසායන - (Rejuvenation)
8. වාජීකරණ - (Aphrodisiac)

ශල්‍ය චිකිත්සාවේ ප්‍රමුඛයා වූ ඍෂි ධන්වන්තරීගේ ශිෂ්‍ය සුශ්‍රුත විසින් සුශ්‍රුත සංහිතා නම් ශල්‍ය ග්‍රන්ථය ලියන ලදී. එය ද 1810-20 කාලයේදී ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කරන ලදුව ඉංග්‍රීසි ශල්‍ය වෛද්‍ය විද්‍යාව දියුණුවට හේතුවිය.

කාය චිකිත්සා - (Medical Treatment) සංශෝධන ශමන වශයෙන් කොටස් දෙනනට බෙදනු ලැබේ. ශමන යනු දෝෂයන් ශෝදනය නොකරනවා මෙන්ම කෝප වූ හා වෘද්ධි වූ දෝෂයන් ශමනය කිරීමයි. ශෝදන උපක්‍රම වලට පෙර හා පසුව යොදනු ලැබේ. ඒවා දීපන, පාචන, ක්ෂුත්, තෘට්, ව්‍යායාම, ආතප, මාරුත වශයෙන් සත්වැදෑරුම්ව උගන්වා ඇත. ශෝධන උපක්‍රම, නස්‍ය, වමන, විරේක, නිරූහ වස්ති, අනුවාසන වස්ති වශයෙන් පස්වැදෑරුම් වෙති.

මිනිස් සිරුර ප්‍රධාන වශයෙන් ලාර්ධිවකාය, මධ්‍යකාය, අධෝකාය වශයෙන් කොටස් තුනකට

වෛද්‍යාචාර්ය ගාමිණී විජේසිංහ

බෙදා ලැබේ. ඉන් ලාර්ධිවකාය ක... ප්‍රබලස්ථානය ලෙසත් මධ්‍ය කාය පිත ප්‍රබලස්ථානය ලෙසත් අධෝ කායවත ප්‍රබලස්ථානය වශයෙන් සළකනු ලැබේ. කඵස්ථානයෙහි රැස්වන මලභූත කඵ නස්‍ය හා වමන ප්‍රතිකාර යෙදීමෙන් ශෝදනය හා ශ්‍රමනය කරනු ලැබේ. මධ්‍යකායෙහි රැස්වූ මලභූත පිත්තය හෙවත් මල කොටස් විරේචන යෙදීමෙන් ශෝදනය හා ශමනය කරනු ලබන අතර, වතස්ථානයෙහි හෙවත් පත්වාශයෙහි ඇතිවූ මලභූත වාතය නිරූහ වස්ති හා ස්නේහන වස්ති යෙදීමෙන් ශෝධනය හා ශමනය කරනු ලැබේ.

සියලුම කාය චිකිත්සා උපක්‍රම ඉහත දැක්වූ උපක්‍රම වලට අයත් වන්නේය. විවිධ රෝගවලට උචිතවන පරිදි ඒවා චිකිත්සා සූත්‍ර නමින් උගන්වා ඇත. වෙනත් අයුරකින් කිවහොත් ඒවා මූලික ප්‍රතිකාර සැළසුම් වෙති.

සාර්ථක චිකිත්සාවක් යෙදීම සඳහා හේතු සූත්‍ර, ලිංග සූත්‍ර, ඖෂධ සූත්‍ර පිළිබඳව මනා දැනුමක් අවශ්‍ය වන්නේය. (හේතු ලිංගෞෂධඥ නම් ස්වස්ථාතුර පරායණම්)

1. හේතු -(Cause of disease) විවිද රෝග විවිධ හේතූන් නිසා ඇතිවේ. ඒවා මැනවින් අධ්‍යයනය කළයුතුය.

2. ලිංග -(Signs and Symptoms according to the pathology) ව්‍යාධි වේදයට අනුකූලව ඇතිවන රූප හා ලක්ෂණ දෙවනුව උගත යුතුය.

3. ඖෂධ -(Medicine) තෙවනුව ප්‍රතිකාර හා ඖෂධ මැනවින් යෙදිය යුතු වන්නේ ය.

එපමණක්ද නොව ඖෂධ, ආහාර, විහරණ ද, මැනවින් යෙදීම ප්‍රතිකාරය සාර්ථක කරගැනීමට අත්‍යවශ්‍ය කරුණු ලෙස ද උගන්වනු ලැබේ. (ඖෂධාන්ත විහාරාණාම්‍යයෝගං සුඛාවහම්)

එසේම දෝෂ, ධාතු මල විඥානය, ශරීර ශක්තිය, කාල පරිණාමය, අග්නිය ප්‍රකෘතිය හා වයස, සාත්මය අසාම්‍යතාවන් සාන්විත ගුණ අධ්‍යයනය චිකිත්සා සාඵල්‍යතාවය සඳහා අත්‍යාවශ්‍ය බව අවධාරණය කර ඇත.

ඔහෙයින් වර්තමානයේ කාලයක් සමගම විශවයේ පරිණාමයන්ට භාජනය වන ප්‍රාණීන්ගේ පරිණාමයට දෝෂ ධාතූන්ගේ ස්වභාවය හා බලයත් තුලනාත්මකව විග්‍රහ කරමින් ප්‍රතිකාර කළයුතු බව විශේෂ වශයෙන් උගන්වා ඇත්තේය. එසේ හෙයින් කලින් කලට ඇතිවන රෝග සඳහා ප්‍රතිකාර ද කාලානුරූව යොදාගත යුතුය යන ඉගැන්වීම අතිශය වැදගත් වන්නේය. මහා මාරිය ඇත අතීතයේ තිබුණි. පසුව රෝගය නැතිව මතකයෙන් ද අත් විය. වර්තමානයේ එම රෝගය මි උණ වශයෙන් නැවත ඇතිවිය. පසමි උණ ද අතීතයේ තිබූ බවට ග්‍රන්ථවල සඳහන්ය. වර්තමානයේ එම රෝගය ද නැවත ඇතිවිය. මිනිසාගේ පැවැත්ම පෝෂණය ආහාරය නිසාම සිදුවන්නේය. රෝග ද වැරදි ආහාර පිළියෙවත් නිසාම බහුලවම ඇතිවන්නාහය.

(ආහාර සම්භවං වස්තු, රෝගශ්චාහාර සම්භවඃ) එනම් වැඩියෙන් ආහාර ගැනීම, අඩුවෙන් ආහාර ගැනීම හා වැරදි ලෙස ආහාර ගැනීමය. වෛද්‍ය ඉතිහාසය දෙස බලනවිට කලින් කලට ඇතිවන රෝග සඳහා ප්‍රතිකාර සොයමින්, මනුෂ්‍ය වර්ගයා මෙන්ම ඝෂ්වයින් කෙරෙහි ද කාරුණිකව කටයුතු කෙරෙමින් වෛද්‍යවරු විශිෂ්ඨ සේවයක් ඉටුකරති. මෙම පිළිවෙත අතීතයේ මෙන්ම වර්තමානයේ ද සිදුවන්නකි. මෙම කරුණු ආදර්ශයට ගනිමින් ම විසින් ද යම් මෙහෙයක් අප සමාජයට ඉටු කල යුත්තේය යන කාරණය සැකෙවින් අධිෂ්ඨාන කර ගනිමින් මූලික ග්‍රන්ථවල පවා ඍජු ඉගැන්වීමක් නොකරන ලද පහත සඳහන් රෝග සඳහා ප්‍රතිකාර ක්‍රමවේදයන් සකස් කරන ලදී.

එනම් :-

1. සන්ධිගතවාත - Atheropathy
2. පාර්කින්සනගේ රෝගය- Parkinson's disease
3. මල්ටිපල් ස්කැලරෝසිස්- Multiple Sclerosis
4. වාතජ ශිරඃ ශූල - Migraine
5. තමකශ්වාස - Bronchial Asthma
6. අපස්මාර - Epilepsy
7. අධික රුධිර පීඩනය- H. B. P.
8. ගිලන්බාරේ සින්ඩ්‍රෝම්- Gullian Baree Syndrom

1.සන්ධිගතවාත - Atheropathy

වාත පූර්ණාදතිස්පර්ශ : සන්ධි ශොථ ගතේ නිලේ ප්‍රසාරණා කුඤ්චනයෝ: ප්‍රවෘත්තිඃ ස වේදනඃ යනුවෙන් රෝග ලක්ෂණ පමණක් උගන්වා ඇත. අනෙක් ග්‍රන්ථවල ද එයම දක්වා ඇත. ප්‍රතිකාර උගන්වා නැත. ඇලෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ද ක්‍රමවත් ව්‍යායාම, වේදනා නාශක ඖෂධ දීම හැරෙන්න නිශ්චිත ප්‍රතිකාර උගන්වා නැත. ම විසින් නිර්දේශිත ප්‍රතිකාරයන් ද අස්ථිවල ස්ථිර ව්‍යාධි වේදය - :ජරාජර්බරබළු ඒඊයදකදටසස්ක ඝස්බරිදී සුව නොවේ. නමුත් වේදනාවෙන් තොරව ඉදිමුම නැතිකොට, අංග චලනය පහසු කරවමින් රෝගයේ පැතිරීම නැති කරන්නේය. ප්‍රධාන උපද්‍රව වන අංග විකලතාවයන්ට පත්